// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2019/19 - 2017 මැයි මස 19 වැනි සිකුරාදා - 2017.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : අනු/4/5/2/7/3/81/1.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/9/2014/WS/149.

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල කුළුන හා නිළ නිවාස ඉදිකිරීම සඳහා ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ පරවශතාවේ විස්තර :*

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිහිඹියගොල්ලෑව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2017.03.15 පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 580 කැබලි අංක 228 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2023 පිහිඹියගොල්ලෑව මූකලාන, කොලොන්ගහවත්ත නමැති පහත සඳහන් ඉඩම් කොටස

**ඉඩමේ නම: පිහිඹියගොල්ලෑව මූකලාන, කොලොන්ගහවත්ත; හිමිකම් කියන්නා: සමරසිරි රාජකරුණා මහතා පිහිඹියගොල්ලෑව; ප්‍රමාණය: හෙක්. 0.2023.**

*උතුරට: කැබලි අංක 227; නැගෙනහිරට: කැබලි අංක 230; දකුණට: කැබලි අංක 230 හා 229; බටහිරට: කැබලි අංක 229 හා 227;*

ඉහත සඳහන් *ඉඩමට/ පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2017.06.22 වැනි දින පෙ.ව. 10.00ට රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි. තව ද, 2017.06.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී *ඉඩම පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. ඩබ්. ඒ. අමුණුගම,
ශ්‍රී. ල. ප. සේ./විශේෂ ශ්‍රේණිය)
ප්‍රාදේශීය ලේකම්,
රඹෑව.

2017 මැයි මස 17 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 130

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ඩීඑස්ඒඑම්/එල්ඒඑන්/08/ඒකිව්/09/සීඕ-VI.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2014/එච්ඩබ්ලිව්/335.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සියඹලාකොටේ ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අවසාන ගම් පිඹුරු අංක 430/5/9 පිඹුරේ සඳහන් කැබලි සඳහා මා විසින් අංක 1951/14 හා 2016.01.27 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තිය යටතේ වන දැන්වීමෙහි ඉඩම් කැබලි අංක 87, 88, 89, 90, 91, 92 සහ 93 යන ඉඩම් කැබලිවල ඉඩමේ නම සියඹලාකොටේහේන්යාය ලෙස සඳහන් වී ඇතත්, එය ගලගාවවත්ත ලෙස නිවැරදි විය යුතු ය.

එච්. තිලකවර්ධන
ප්‍රාදේශීය ලේකම් හා
අත්කර ගැනීමේ නිලධාරි
අම්බලන්තොට.

2017 මැයි මස 19 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අම්බලන්තොට.

06-131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.